# ඇගයීම් නිර්ණායක

| අංකය | ලකුණු ලබාදෙනු ලබන කාණ්ඩයන් | කාණ්ඩයට අදාල උපරිම ලකුණු ප්‍රමාණය | නව නිපැයුම්කරුට හිමි ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| **01** | **2020 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා කාලය තුල සහසක් නිමැවුම් තරඟයට සහභාගී වී තිබීම**<br><br>මෙම කාණ්ඩය යටතේ ලකුණු ලබාදීමේදී සැලකිය යුතු කරුණු පහත දැක්වේ.<br><br>• මෙහිදී 2020 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා එක් වසරකදී සහසක් නිමැවුම් තරඟයට ජාතික මටටමේ හෝ පළාත් මට්ටමේ හෝ සහභාගීත්වයක් ලබා දී තිබේ නම් මූලික ලකුණු 10ක් නව නිපැයුම්කරුට හිමි වේ.<br><br>• 2020 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා එක් වසරකට වැඩියෙන් සහසක් නිමැවුම් තරඟය සඳහා සහභාගී වී ඇති අවස්ථාවකදී සෑම අමතර වසරක් සඳහාම අමතර ලකුණු 1ක් බැගින් උපරිමය අමතර ලකුණු 5ක් දක්වා එම අමතර වසර ගණන වෙනුවෙන් හිමිවේ.<br><br>• එක වසරක් තුල නව නිපැයුම් කිහිපයක් ඉදිරිපත් කලද එය එක් සහභාගීත්වයක් ලෙස පමණක් සලකා කටයුතු කලයුතු අතර ඉදිරිපත් කරන ලද නව නිපැයුම් ප්‍රමාණය පිළිබඳව මෙම කාණ්ඩයේදී නොසැලකිය යුතුය. | 15 | |
| **02** | **2020 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා කාලය තුල සහසක් නිමැවුම් තරඟයේ ජාතික මට්ටමේ ජයග්‍රහණයක් ලබා තිබීම.**<br><br>මෙම කාණ්ඩය යටතේ ලකුණු ලබාදීමේදී සැලකිය යුතු කරුණු පහත දැක්වේ.<br><br>• මෙහිදී 2020 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා එක් වසරකදී සහසක් නිමැවුම් තරඟයේ ජාතික මටටමේ ජයග්‍රහණයක් ලබා තිබේ නම් මූලික ලකුණු 20ක් නව නිපැයුම්කරුට හිමි වේ.<br><br>• 2020 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා එක් වරකට වැඩියෙන් සහසක් නිමැවුම් තරඟයේ ජාතික මටටමේ ජයග්‍රහණයක් ලබා තිබෙන අවස්ථාවකදී සෑම අමතර ජයග්‍රහණයක් සඳහාම අමතර ලකුණු 02 බැගින් අමතර ජයග්‍රහණ 05ක් සඳහා ලකුණු 10ක් උපරිම වශයෙන් හිමිවේ.<br><br>• නව නිපැයුම් එකකට වැඩි ගණනක් සඳහා එක් වසරක් තුල එක් වරකට වැඩි සහසක් නිමැවුම් ජාතික මටටමේ ජයග්‍රහණයන් ලබා තිබෙන අවස්ථාවලදී එම ජයග්‍රහණ වෙන වෙනම ලද ජයග්‍රහණ ලෙස සලකා කටයුතු කලයුතුය. | 30 | |

| අංකය | ලකුණු ලබාදෙනු ලබන කාණ්ඩයන් | කාණ්ඩයට අදාල උපරිම ලකුණු ප්‍රමාණය | නව නිපැයුම්කරුට හිමි ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| **03** | **පේටන්ට් බලපත්‍රයක් ලබා තිබීම සහ/ හෝ අයදුම් කර තිබීම**<br><br>මෙම කාණ්ඩය යටතේ ලකුණු ලබාදීමේදී සැලකිය යුතු කරුණු පහත දැක්වේ.<br><br>• පේටන්ට් බලපත්‍රයක් ලබා තිබෙන නව නිපැයුම්කරුවන් සඳහා පේටන්ට් බලපත්‍රය නිකුත් කර තිබෙන වර්ෂය පිළිබඳව නොසලකා මූලික ලකුණු 20ක් නව නිපැයුම්කරුට හිමි වේ. එමෙන්ම පේටන්ට් බලපත්‍ර එකට වැඩියෙන් ලබා ඇති නව නිපැයුම්කරුවන් සඳහා සෑම අමතර පේටන්ට් බලපත්‍රයක් සඳහාම අමතර ලකුණු 02 බැගින් උපරිම ලකුණු 10ක් දක්වා ලැබේ.<br><br>• 2020 වර්ෂයේ සිට 2026 වර්ෂය වර්ෂය දක්වා පේටන්ට් බලපත්‍රයක් අයදුම්කර තිබෙන නව නිපැයුම්කරුවන් සඳහා මූලික ලකුණු 10ක් නව නිපැයුම්කරුට හිමි වේ. එමෙන්ම පේටන්ට් බලපත්‍ර අයදුම්කර තිබෙන නව නිපැයුම්කරුවන් සඳහා සෑම අමතරව අයදුම්කර තිබෙන පේටන්ට් බලපත්‍රයක් සඳහාම අමතර ලකුණු 01 බැගින් උපරිම ලකුණු 05ක් දක්වා ලබාදිය හැකිය.<br><br>• මෙම කාණ්ඩය යටතේ උපරිමය ලකුණු 30ක් ඉක්මවා නොයන පරිදි එකම නව නිපැයුම්කරුවෙකු සඳහා පේටන්ට් බලපත්‍ර ලබාගෙන තිබෙන මෙන්ම අයදුම් කර තිබෙන අවස්ථාවන් දෙක යටතේ දීම ලකුණු ලබාදිය හැකිය. එහිදී මූලික ලකුණු ලබාදිය හැක්කේ එක් අවස්ථාවකට පමණක් වන අතර අනෙකුත් සෑම අවස්ථාවක්ම අමතර ලකුණු ලෙස ලබා දිය යුතුය. | 30 | |
| **04** | **කොමිසම මඟින් නිකුත් කරනු ලබන නව නිපැයුම්කරුවන් සඳහා වන හැඳුනුම්පතක් ලබා තිබීම හෝ අයදුම් කර සුදුසුකම් ලබා තිබීම**<br><br>මෙම කාණ්ඩය යටතේ ලකුණු ලබාදීමේදී සැලකිය යුතු කරුණු පහත දැක්වේ.<br><br>• කොමිසම මඟින් නිකුත් කරනු ලබන නව නිපැයුම්කරුවන් සඳහා වන හැඳුනුම්පතක් ලබා තිබෙන හෝ අයදුම් කර සුදුසුකම් ලබා තිබෙන නව නිපැයුම්කරුවන් සඳහා හැඳුනුම්පත ලබා ඇති කාණ්ඩය පිළිබඳව නොසලකා මූලික ලකුණු 10ක් නව නිපැයුම්කරුට ලබාදිය යුතුය.<br><br>• හැඳුනුම්පත ලබා ඇති කාණ්ඩය 01 වන නව නිපැයුම්කරුවන් සඳහා අමතර ලකුණු 15ක් නව නිපැයුම්කරුට ලබා දිය යුතුය. හැඳුනුම්පත ලබා ඇති කාණ්ඩය 02 හෝ 03 වන නව නිපැයුම්කරුවන් සඳහා අමතර ලකුණු 10ක් නව නිපැයුම්කරුට ලබා දිය යුතුය. හැඳුනුම්පත ලබා ඇති කාණ්ඩය 04 හෝ 05 වන නව නිපැයුම්කරුවන් සඳහා අමතර ලකුණු 05ක් නව නිපැයුම්කරුට ලබා දිය යුතුය. | 25 | |
| | **මුළු ලකුණු** | **100** | |